# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

## අභියාචනා අංක:- AAT/240/2025 (PSC)

කේ.ඩබ්.චතුරිකා සඳමාලි
**අභියාචක**

**එදිරිව,**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

දිනය : 2026.05.19

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් එන්.ජී.එස්.නිලූකා කුමාරි මහත්මිය.

**-නියෝගය-**

අභියාචක කේ.ඩබ්.චතුරිකා සඳමාලි යන අය විසින් 2025.09.27 දින මෙම විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනා පෙත්සම මඟින් ඉල්ලා ඇත්තේ, ඇය වෙත නිකුත් කර ඇති සේවය අතහැර යාමේ නියෝගය ඉවත් කර ඇයව නැවත සේවයේ පිහිටුවන ලෙසයි. අභියාචක 2023.06.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවය අතහැර ගියා සේ සළකමින්, 2023.08.12 දිනැති ලිපිය, කරාපිටිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂ විසින් අභියාචක වෙත යවා ඇත. එම ලිපිය ලැබීමෙන් අනතුරුව අභියාචක විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කරන ලද 2024.07.09 දිනැති ඉල්ලීම සළකා බැලූ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඇයගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. ඉන් අනතුරුව, අභියාචක විසින් මෙම විනිශ්චය අධිකාරය වෙත ඉහත කී අභියාචනා පෙත්සම ඉදිරිපත් කර ඇත.

අභියාචක 2023.05.07 දින රිය අනතුරකට භාජනය වී ඇත. ඒ අනුව ප්‍රතිකාර සඳහා ඇල්පිටිය මූලික රෝහල වෙත ඇයව ඇතුළත් කර ඇත. එය තහවුරු කිරීම සඳහා ඇල්පිටිය රෝහල මඟින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කර ඇත. අනතුරුව අභියාචක දේශීය වෛද්‍ය ප්‍රතිකාර ලබා ගෙන ඇති බවට කරුණු ඉදිරිපත් කරමින්, එය සනාථ කිරීම සඳහා වෛද්‍ය එස්.ඩබ්.සී.විජයනායක විසින් නිකුත් කර ඇති 2023.06.28 දිනැති ආයුර්වේද වෛද්‍ය සහතිකය ඉදිරිපත් කර ඇත. එම වෛද්‍ය සහතිකය අනුව අභියාචක 2023.06.17 දින සිට දින 14 කාලයක් වෛද්‍ය ප්‍රතිකාර ලද බව සඳහන් වේ. කරාපිටිය රෝහල මඟින් නිකුත් කරන ලද වෛද්‍ය සහතිකයක්ද අභියාචකගේ අසනීප තත්ත්වය තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කර ඇත. ඒ අනුව පෙනී යන්නේ, අභියාචක සේවයට වාර්තා නොකිරීමට හේතුව වී ඇත්තේ, ඇය රිය අනතුරකට භාජනය වී රෝගාතුර වී තිබීමයි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ, සේවය අතහැර යාමේ නිවේදනය අනුව අභියාචක සේවය හැර ගොස් ඇත්තේ, 2023.06.17 දිනදී බවයි. එම දිනය ඒ ආකාරයට යොදා ඇත්තේ, අභියාචක විසින් ඉදිරිපත් කරන ලද වෛද්‍ය සහතික සළකා බැලීමෙන් අනතුරුව බව පෙනී යයි. කෙසේ වෙතත්, ඉහතින් සඳහන් කර ඇති පරිදි ජුනි 17 දින සිට දින 14ක කාලය ඇය තවදුරටත් ප්‍රතිකාර ලබා ඇති බවට 2023.06.28 දිනැති වෛද්‍ය සහතිකය ඉදිරිපත් කර ඇත. මේ අනුව පැහැදිළිව පෙනී යන්නේ, අභියාචකට සේවය හැර යාමට හේතු වී ඇත්තේ, ඇය රිය අනතුරකට භාජනය වීම හේතුවෙන් දීර්ඝ කාලීනව ප්‍රතිකාර ලබා ගැනීම බවයි. ඒ අනුව අභියාචක සේවය අතහැර යාමට හේතු වූ කරුණු පිළිනොගැනීමට හේතුවක් නැත.

මෙම කරුණ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2026.01.02 දිනැති වාර්තාව කෙරෙහිද විනිශ්චය සභාවේ අවධානය යොමු කරන ලදී. එහි සඳහන් වන්නේ, අභියාචක දැනට වයස අවුරුදු 32 වන බවත්, ඇය වසර 07 ක සේවා කාලයක් වැටුප් වර්ධක 03ක්ද සමඟ සම්පූර්ණ කර ඇති බවත්ය. තවද, ඇයට එරෙහිව කිසිඳු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවද එහි වැඩිදුරටත් සඳහන් වේ. ඇයට සිදු වූ අනතුර නිසා

ඇයගේ අස්ථි බිඳීමක් සිදු වී ඇති බව තහවුරු කිරීමට වෛද්‍ය වාර්තාද ඉදිරිපත් කර ඇති බවත්, එම වාර්තාවෙහි සඳහන් කර ඇත.

ඉහත කරුණු සළකා බලා අභියාචක වෙත නිකුත් කර ඇති සේවය අතහැරයාමේ නිවේදනය ඉවත් කිරීමට විනිශ්චය සභාව තීරණය කරමු. එම තීරණය පරිදි අභියාචක වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නියෝග කරමු. මෙම නියෝගය හේතුවෙන්, අභියාචක හට කිසිඳු හිඟ වැටුපක් හෝ වෙනත් ප්‍රතිලාභයක් හිමි නොවිය යුතුය.

ඉහත කොන්දේසිවලට යටත්ව අභියාචකගේ ඉල්ලීමට අවසර දෙමු.

අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/